# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

## 2007 අංක 4 දරන ශ්‍රී ලංකා දෘෂ්‍යාබාධිත ජනතා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ **2007** ජනවාරි මස **29** වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2007 පෙබරවාරි මස 02 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ :** රු. 6.75 යි.     තැපැල් ගාස්තුව **:** රු. 5.00 යි.

## 2007 අංක 4 දරන ශ්‍රී ලංකා දෘෂ්‍යාබාධිත ජනතා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2007 ජනවාරි මස 29 වන දින]

එල්. ඩී. ඕ.— (අයි. එන්. සී.) 24/2004

### ශ්‍රී ලංකා දෘෂ්‍යාබාධිත ජනතා සම්මේලනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

"ශ්‍රී ලංකා දෘෂ්‍යාබාධිත ජනතා සම්මේලනය" යනුවෙන් සඳහන් කරනු ලබන සහ හඳුන්වනු ලබන සමිතියක්, ඒ සමිතියේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව ඒ සමිතියට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබුණු හෙයින් ද :

ඒ සම්මේලනය පිහිටුවන ලද්දේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, ඒ පරමාර්ථ සහ කරුණු ඒ සම්මේලනය විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ ඒ සම්මේලනය සංස්ථාගත කිරීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2007 අංක 4 දරන ශ්‍රී ලංකා දෘෂ්‍යාබාධිත ජනතා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු "සම්මේලනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා දෘෂ්‍යාබාධිත ජනතා සම්මේලනයේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කරගනු ලබන සාමාජිකයන්, ශ්‍රී ලංකා දෘෂ්‍යාබාධිත ජනතා සම්මේලනය යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් විය යුතු අතර එකී සංස්ථාපිත නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි ය. තව ද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද එය පාවිච්චි කිරීමේ සහ සංස්ථාවේ විධායක කමිටුව තීරණය කරනු ලැබිය හැකි පරිදි එය වෙනස් කිරීමේ ද සම්පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. ශ්‍රී ලංකා දෘෂ්‍යාබාධිත ජනතා සම්මේලනය සංස්ථාගත කිරීම.

3. සංස්ථාව සංස්ථාපනය කිරීමට අරමුණු කොටගත් පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) ශ්‍රී ලංකාවේ වෙසෙන සියලු දෘෂ්‍යාබාධිත පුද්ගලයන් ඒකරාශී කිරීම ;

2-H 022843- 4,200 (2004/09)

(ආ) දෘෂ්‍යාබාධිත තැනැත්තන්ට සුභ සාධක කටයුතු සැලසීම සහ දෘෂ්‍යාබාධිත ජන කොටසට පොදුවේ හා තනි තනිව මුහුණ දීමට සිදුවන ප්‍රශ්නවලට අදාළව විසඳුම් සෙවීම ;

(ඇ) දෘෂ්‍යාබාධිත ජනයාට පොදුවේ හා තනි තනිව මුහුණ දීමට සිදුවන ප්‍රශ්ණ පිළිබඳව රජය හා වෙනත් සංවිධාන දැනුවත් කිරීම ;

(ඈ) රජය සහ වෙනත් සංවිධාන මගින් දෘෂ්‍යාබාධිත ජනයා වෙත සපයනු ලබන විවිධ සේවාවන් පිළිබඳව දැනුවත් කිරීම හා ඒ වැඩ පිළිවෙලවලින් ප්‍රතිලාභ අත්කර ගැනීම සඳහා ඔවුනට උදව් කිරීම ;

(ඉ) දෘෂ්‍යාබාධිත ජනයාට අවශ්‍ය සේවා සහ ආධාර පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම ;

(ඊ) අන්ධභාවය හා අන්ධ පුද්ගලයන් පිළිබඳව සමාජයෙහි පවත්නා වැරදි ආකල්ප හා වැරදි මත දුරු කිරීම සඳහා සුදුසු උත්සාහයන් දැරීම ;

(උ) දෘෂ්‍යාබාධිත ජනයාට මුහුණ දීමට සිදුවන නෛතික ප්‍රශ්න පිළිබඳව විසඳුම් සෙවීමට සමථකරුවකු ලෙස ක්‍රියාකිරීම ;

(ඌ) සංස්ථාවට සමාන අරමුණු ඇති දේශීය හා විදේශීය ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම ;

(එ) දෘෂ්‍යාබාධිත ජනයාට අවශ්‍ය සුභසාධක සේවා සැලසීම සඳහා අරමුදල් එකතු කිරීම ;

(ඒ) අන්ධභාවය ඇතිවන හේතු මුලිනුපුටා දැමීම සඳහා හැකි සෑම ආකාරයකින්ම ක්‍රියා කිරීම ;

(ඔ) දෘෂ්‍යාබාධිත ජනයා සඳහා විශේෂයෙන් සාදන ලද සහ සම්පාදිත "වැඩිහිටි නිවාස" පිහිටුවා පවත්වාගෙන යාම ;

(ඕ) දෘෂ්‍යාබාධිත ජනයා සඳහා පුනරුත්ථාපන මධ්‍යස්ථාන හා සුභසාධක මධ්‍යස්ථාන පිහිටුවා පවත්වාගෙන යාම ;

(ක) ඉහත සඳහන් අරමුණු සියල්ලම හෝ යම් අරමුණක් ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය හෝ සුදුසු වෙනත් සියලු පියවර ගැනීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**4**. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, බැංකු ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම සහ වැසීම, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම, ආධාර මුදල් හා පරිත්‍යාග පිළිගැනීම හෝ එකතු කිරීම, සංස්ථාවේ අරමුදල් ආයෝජනවල යෙදවීම සහ සංස්ථාවේ පරමාර්ථ ඉටුකිරීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීම, සේවයේ නියුක්ත කිරීම සහ සේවයෙන් නෙරපීම ද ඇතුළුව සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ ඉන් යම් පරමාර්ථයක් හෝ ඉටු කර ගැනීම සඳහා සහ සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කරුණු සහ දේ කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5**. (1) මේ පනතේ විධිවිධානවලට සහ සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව, සංස්ථාවේ නිළධරයන්ගෙන් සහ එකී රීතිවලින් විධිවිධාන සලසා ඇති පරිදි වූ සහ ඒ රීතිවලට අනුකූලව තෝරා පත් කරනු ලබන සාමාජික සංඛ්‍යාවකින් සමන්විත වන විධායක කමිටුවක් විසින් සංස්ථාවේ කටයුතු පරිපාලනය කළ යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම විධායක කමිටුව, මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී සම්මේලනයේ විධායක කමිටුවේ සාමාජිකයන් වශයෙන් ධුර දැරුවා වූ ද, සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

සංස්ථාවේ රීති.

**6**. (1) සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් පහත දැක්වෙන කරුණු සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, සංස්ථාව විසින් කලින් කළ සෑදීම නීත්‍යනුකූල වන්නේ ය :—

(අ) සාමාජිකයන් ඇතුලු කර ගැනීම, ඔවුන් වර්ග කිරීම, ඉල්ලා අස්වීම හා ඔවුන් නෙරපීම ;

(ආ) නිලධරයන් සහ විධායක කමිටුව තෝරා පත් කර ගැනීම සහ සංස්ථාවේ විවිධ නිලධරයන්, නියෝජිතයන් සහ සේවකයන් විසින් ඉටු කළ යුතු කාර්ය භාරය ;

(ඈ) සංස්ථාවේ සහ විධායක කමිටුවේ රැස්වීම්වල කටයුතු කර ගෙන යාමේ දී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය ;

(ඇ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම, සංස්ථාවේ අරමුදල්වල භාරකාරත්වය සහ සංස්ථාවේ ගිණුම් පවත්වාගෙන යාම හා ඒවා විගණනය කිරීම ; සහ

(ඉ) සාමාන්‍යයෙන්, සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම.

(2) සංස්ථාව විසින් (1) වන උපවගන්තිය යටතේ සාදනු ලැබූ යම් රීතියක්, ඒ රීතිය සාදනු ලැබූ ආකාරයෙන් ම සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සම්මේලනයෙන් ගෙවිය යුතු සහ සම්මේලනයට අය විය යුතු ණය.

7. මෙම පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට වහාම පෙරාතුව ම වූ දිනයේ දී සම්මේලනයේ පැවති සියලුම ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට සම්මේලනයට අයවිය යුතු හෝ ගෙවිය යුතු සියලුම ණය, දායක මුදල් සහ සම්මාදම් මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

8. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් හෝ සංස්ථාව සතුවන්නා වූ යම් චංචල හෝ නිශ්චල දේපළක් භාර ගැනීමට සහ දැරීමට නීතියෙහි ලා සංස්ථාවට බලය ඇති අතර, ඒ දේපළ සංස්ථාවේ රීතිවලට යටත්ව විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන් ආකාරයකින් බැහැර කිරීමට හෝ බැඳීමකට හෝ අයභාරයකට යටත් කිරීමට පූර්ණ බලය ඇතිව, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

9. සංස්ථාවේ රීතිවලින් විධිවිධාන සලස්වා ඇති නිලධරයන් සංඛ්‍යාවක් ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු ය. එකී නිලධරයන් විසින් තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන්, එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

**10**. ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනයම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**11**. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.